## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

# ව්‍යාපාර අධ්‍යයනය

## විෂය නිර්දේශය

12 වන සහ 13 වන ශ්‍රේණි

**(2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව

විද්‍යා හා තාක්ෂණ පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය.

## 1.0 හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සඳහා නිපුණතා පාදක විෂය නිර්දේශ ලෙස 2007 වර්ෂයේ දී ව්‍යවසායකත්ව අධ්‍යයනය විෂයයත්, 2008 වර්ෂයේ දී ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂයයත් හඳුන්වා දෙන ලදි. එම විෂය නිර්දේශවල ඇති කරන ලද වෙනස්කම් ද, ගෝලීය වශයෙන් සිදුවෙමින් පවතින නව ප්‍රවණතා ද සැලකිල්ලට ගනිමින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයමාලාවේ ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය නිපුණතා පාදක ව නැවත සකස් කිරීම සිදු කරන ලදි.

ව්‍යාපාර අධ්‍යයන විෂය ඉතා ජනප්‍රිය වාණිජවිද්‍යා විෂයයකි. එමෙන් ම ප්‍රායෝගික විෂයයකි. මෙම විෂය ආර්ථික විද්‍යාව, කළමනාකරණය, සමාජ විද්‍යාව ආදී විෂයවලින් පෝෂණය වූවකි. ව්‍යාපාර අධ්‍යයනය විෂය උසස් පෙළ වාණිජවිද්‍යා විෂය ධාරාවේ විෂයයක් ලෙස මෙන් ම, කලා විෂයධාරව හදාරන සිසුනට ද තෝරා ගත හැකි විෂයයක් වේ. මෙම විෂය හැදෑරීමෙන් ලබා ගන්නා දැනුම කුසලතා හා ආකල්ප සාමාන්‍ය ජීවිතයේ ප්‍රයෝජනය සඳහා ද, උසස් අධ්‍යාපනයට මෙන් ම වාණිජවිද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපනය සඳහා ද යොදා ගැනීම පිණිස උදව් වේ.

ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්වීම්වලට අනුවර්තනය වීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතාවලින් සමෝධානිත වූ ජීවිත පුරුදු හෙවත් නිපුණතා සහිත පුරවැසියකු බිහිකිරීමට හැකිවන ආකාරයේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියක් මෙහි යෝජනා කෙරේ.

උසස් අධ්‍යාපනය සඳහා යොමු නොවන අයට වෘත්තියක් හෝ ස්වයං රැකියාවක් හෝ කිරීමට අවශ්‍ය නිපුණතා ද ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඵලදායී ලෙස දායක විය හැකි ව්‍යවසායකත්ව කුසලතා ද ලබාදීම මෙන්ම පෞද්ගලික දිවි පැවැත්මෙහි ගුණාත්මක සහ සඵලදායී වර්ධනයක් ද මේ විෂය නිර්දේශය මගින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ ම ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් නිර්මාණශීලී ව ජනනය කිරීම, වැඩි දියුණු කිරීම හා ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම මෙම නිර්දේශයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් මෙහි ඇතුළත් ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමෝපාය පන්ති කාමරය තුළ මෙන් ම එයින් බාහිරව ද ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ. ව්‍යාපාර ඉතා ප්‍රායෝගික බැවින් ව්‍යාපාරවලට අදාළ ව්‍යවහාර ඉතා ඉක්මනින් වෙනස්කම්වලට භාජනය වන හෙයින් ඒ පිළිබඳ අවධානයෙන් සිට ගුරු භවතුන් වශයෙන් ඔබගේ දැනුම යාවත්කාලීන කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2.0 විෂය නිර්දේශයේ අරමුණු

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවියහැකි ආකාර විමසා බැලීමට යොමු කිරීම.
- ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මඟින් එයට අනුවර්තනයවීමට සූදානම් කිරීම.
- ව්‍යාපාර පිළිබඳ ව ලබා ගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික ව භාවිත කිරීමට යොමු කිරීම.
- ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත් සංකීර්ණ විෂය කරුණු සරල ව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා ලබාදීම.
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථා දීම.
- ව්‍යාපාර පද්ධතියක ශ්‍රිත අතර සමෝධානිත බව පෙන්වා දීම.
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරතවීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා දීම.
- ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනගා ගැනීමට අවස්ථා සැපයීම.
- සැලසුම් සහගත ව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙනයාමට අවශ්‍ය පරිචය ලබා දීම.
- වෘත්තීය භූමිකාවල සාර්ථක ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා දීම.
- සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා ලබා දීම.
- උසස් අධ්‍යාපනයට යොමුවීම උදෙසා ප්‍රවේශයක් ලබා දීම.

# විෂය නිර්දේශය පාසල් වාරවලට අනුව බෙදා ගැනීමට යෝජිත උපදෙස්

| ශ්‍රේණිය | වාරය | නිපුණතා හා නිපුණතා මට්ටම් | |
|---|---|---|---|
| 12 වන ශ්‍රේණිය | පළමුවන වාරය | නිපුණතා මට්ටම 1.1 සිට නිපුණතා මට්ටම 4.6 දක්වා | (නිපුණතා මට්ටම් 19) |
| | දෙවන වාරය | නිපුණතා මට්ටම 5.1 සිට නිපුණතා මට්ටම 7.3 දක්වා | (නිපුණතා මට්ටම් 19) |
| | තුන්වන වාරය | නිපුණතා මට්ටම 7.4 සිට නිපුණතා මට්ටම 11.7 දක්වා | (නිපුණතා මට්ටම් 19) |
| 13 වන ශ්‍රේණිය | පළමුවන වාරය | නිපුණතා මට්ටම 12.1 සිට නිපුණතා මට්ටම 14.4 දක්වා | (නිපුණතා මට්ටම් 24) |
| | දෙවන වාරය | නිපුණතා මට්ටම 14.5 සිට නිපුණතා මට්ටම 16.7 දක්වා | (නිපුණතා මට්ටම් 23) |
| | තුන්වන වාරය | නිපුණතා මට්ටම 16.8 සිට නිපුණතා මට්ටම 18.11 දක්වා | (නිපුණතා මට්ටම් 23) |

**3.0 විෂය නිර්දේශය**

**3.1 - 12 වන ශ්‍රේණිය**

# නිපුණතා, නිපුණතා මට්ටම්,විෂය අන්තර්ගතය හා කාලච්ඡේද

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| **1. ව්‍යාපාරවලට සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා ව්‍යාපාර පදනම විමසයි.** | | | **40** |
| | 1.1 ව්‍යාපාර සංකල්පය විග්‍රහ කරයි. | • ව්‍යාපාර අර්ථකථනය<br>  • අවශ්‍යතා හා වුවමනා<br>  • නිෂ්පාදිත<br>  • ඉල්ලුම<br>  • නිෂ්පාදනය<br>  • වෙළෙඳපොළ<br>• ව්‍යාපාරවල අවශ්‍යතාව<br>• ව්‍යාපාර අරමුණු | 06 |
| | 1.2 ව්‍යාපාර විකාශනය විමසමින් ව්‍යාපාරවල ප්‍රවණතා පුරෝකථනය කරයි. | • ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය/ඍජු නිෂ්පාදනය<br>• පුද්ගල විශේෂීකරණය<br>• වක්‍ර නිෂ්පාදනය<br>• භාණ්ඩ හුවමාරු ක්‍රමය<br>• වෙළෙඳාම<br>• මුදල් භාවිතය හා මුදලේ විකාශනය<br>• කෘෂි ආර්ථිකය<br>• කාර්මික ආර්ථිකය<br>  • උපකාරක සේවා/ව්‍යාපාර සහාය සේවා<br>  • වාණිජ්‍යය<br>• දැනුම පදනම් කරගත් ආර්ථිකය (තොරතුරු ආර්ථිකය)<br>  • විද්‍යුත් ව්‍යාපාර<br>  • විද්‍යුත් වාණිජ්‍යය<br>• ව්‍යාපාරවල නව ප්‍රවණතා | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 1.3 විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග කරයි. | • ව්‍යාපාර වර්ග කිරීමේ නිර්ණායක<br>• නිෂ්පාදනයේ ස්වභාවය අනුව<br>• නිෂ්පාදන අංශය අනුව<br>• හිමිකාරත්වය අනුව<br>• අරමුණ අනුව<br>• පරිමාණය අනුව | 05 |
| | 1.4 ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් නිෂ්පාදන අංශයේ දායකත්වය අගය යි. | • දළ දේශීය නිෂ්පාදිතයේ විවිධ අංශ<br>• කෘෂිකාර්මික<br>• කාර්මික<br>• සේවා | 05 |
| | 1.5 ව්‍යාපාර, යෙදවුම් නිමැවුම් ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි. | • යෙදවුම් (සම්පත්)<br>• භූමිය<br>• ශ්‍රමය<br>• ප්‍රාග්ධනය<br>• ව්‍යවසායකත්වය<br>• තොරතුරු<br>• කාලය<br>• දැනුම<br>• ව්‍යාපාර කාර්ය<br>• පරිපාලනය<br>• මෙහෙයුම් (නිෂ්පාදනය) | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • අලෙවිකරණය<br>• මූල්‍යායනය<br>• මානව සම්පත් කටයුතු<br>• පර්යේෂණ හා සංවර්ධන<br>• නිමැවුම<br>• භාණ්ඩ<br>• සේවා | |
| | 1.6 අවශ්‍යතා හා වුවමනා සපුරාලන විවිධ නිෂ්පාදිත වර්ග කරයි. | • භාණ්ඩ හා සේවා වර්ගීකරණය<br>• භාණ්ඩ වර්ගීකරණය<br>• පැවැත්ම අනුව<br>• භාවිතය අනුව<br>• සේවා වර්ගීකරණය<br>• ව්‍යාපාර සේවා<br>• ඍජු සේවා | 06 |
| | 1.7 ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු විමසයි. | • ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව<br>• අයිතිකරුවන්/කොටස්හිමියන්<br>• කළමනාකරුවන්<br>• සේවකයන්<br>• ගනුදෙනුකරුවන්<br>• විභව ආයෝජකයින්<br>• ණයහිමියන්<br>• රජය<br>• ප්‍රජාව<br>• වෙනත්<br>• ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව ව්‍යාපාර කෙරේ උනන්දුවීමට හේතු | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| **2. ව්‍යාපාර පරිසරය ව්‍යාපාරවල පැවැත්ම කෙරෙහි බලපෑම් ඇති කරන බව තහවුරු කරයි.** | | | **20** |
| | 2.1 ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කිරීමේ පහසුව සඳහා ව්‍යාපාර පරිසරය වර්ග කරයි. | • ව්‍යාපාර පරිසරය<br>• අර්ථ දැක්වීම<br>• අධ්‍යයනයේ අවශ්‍යතාව<br>• වර්ග කිරීම<br>• අභ්‍යන්තර පරිසරය<br>• බාහිර පරිසරය<br>• ආසන්න පරිසරය<br>• පොදු/ සාර්ව පරිසරය | 04 |
| | 2.2 අභ්‍යන්තර පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි. | • අභ්‍යන්තර පරිසරයේ බලවේග<br>• අයිතිකරුවන්<br>• කළමනාකරුවන්<br>• සේවකයන්<br>• සංස්කෘතිය<br>• සංවිධාන ව්‍යුහය<br>• සම්පත් | 05 |
| | | • අභ්‍යන්තර පරිසරයේ බලවේග ආශ්‍රිත ශක්තීන් හා දුර්වලතා | 05 |
| | 2.3 ආසන්න පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි. | • ආසන්න පරිසරයේ බලවේග<br>• ගනුදෙනුකරුවන්/ පරිභෝගිකයන්<br>• සැපයුම්කරුවන්<br>• තරගකරුවන්<br>• වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂා කරන නව ව්‍යාපාරිකයන්<br>• ආදේශන භාණ්ඩ නිෂ්පාදනය කරන්නන්<br>• ආසන්න පරිසරයේ බලවේග ආශ්‍රිත අවස්ථා හා තර්ජන | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.4 සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි. | • පොදු/ සාර්ව පරිසරයේ බලවේග<br>  • ආර්ථික පරිසරය<br>  • දේශපාලන පරිසරය හා නෛතික පරිසරය<br>  • තාක්ෂණික පරිසරය<br>  • ප්‍රජා පරිසරය<br>  • ස්වාභාවික පරිසරය<br>  • සමාජයීය හා සංස්කෘතික පරිසරය<br>  • ගෝලීය පරිසරය<br>• සාර්ව පරිසරයේ බලවේග ආසන්න පරිසර බලවේග කෙරෙහි ඇති කරන බලපෑම<br>• සාර්ව පරිසරයේ බලවේග අතර අන්තර් බලපෑම | 06 |
| 3.ගතික ව්‍යාපාර පරිසරයට අනුගත වීමට ව්‍යාපාර සමාජ වගකීම් හා ආචාරධර්ම කෙරෙහි සැලකිලිමත් වෙයි. | 3.1 ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම අගය යි. | • ව්‍යාපාරවල සමාජයීය වගකීම<br>  • අර්ථ දැක්වීම<br>  • සමාජ වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව<br>  • සමාජයීය වගකීම් ඉටු විය යුතු පාර්ශ්ව<br>    • අයිතිකරුවන්<br>    • සේවකයින්<br>    • ගනුදෙනුකරුවන්<br>    • රජය<br>    • ප්‍රජාව<br>    • පරිසරය | **15**<br>07 |
| | 3.2 ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව තහවුරු කරයි. | • ව්‍යාපාර ආචාරධර්ම<br>  • අර්ථ දැක්වීම<br>  • ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීමේ වැදගත්කම<br>  • ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක<br>    • ව්‍යාපාරය<br>    • ගනුදෙනුකරු<br>    • සේවකයා<br>    • තරගකරුවන්<br>    • සමාජ සංස්කෘතිය<br>    • සංවිධාන සංස්කෘතිය<br>    • ප්‍රායෝගික බව | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| **4. රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර පවත්වා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කරයි.** | | | **35** |
| | 4.1 රජය ව්‍යාපාර කෙරේ බලපෑම් කරන අයුරු විමර්ශනය කරයි. | • රජය<br>  • මධ්‍යම රජය<br>  • පළාත් සභා<br>  • පළාත් පාලන ආයතන<br>• රජය ව්‍යාපාරවලට බලපෑම් කරන ආකාරය<br>  • යටිතල පහසුකම් සැපයීම<br>  • තරගකරුවකුවීම<br>  • ගනුදෙනුකරුවකුවීම<br>  • ප්‍රතිපත්ති සම්පාදනය කිරීම<br>  • නීතිරීති පැනවීම<br>  • දිරිගැන්වීම් ලබාදීම<br>  • බදු අයකරන්නකුවීම | 05 |
| | 4.2 රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි. | • රජයක ආර්ථික අරමුණු<br>  • ආර්ථික වර්ධනය හා සංවර්ධනය<br>  • පූර්ණ සේවා නියුක්තිය<br>  • ආර්ථික ස්ථායිතාව<br>  • සාධාරණ ආදායම් ව්‍යාප්තිය<br>  • යහපත් අන්තර්ජාතික වෙළෙඳාම<br>• ව්‍යාපාර, රජයේ අරමුණු ඉටු කිරීමට දායක වන ආකාරය<br>  • බදු ගෙවීම.<br>  • දේශීය සම්පත් භාවිත කිරිම.<br>  • රජයේ ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම<br>  • නීති රීති පිළිපැදීම<br>  • සේවා නියුක්තියට දායක වීම<br>  • පරිසරයට වන හානි අවම කිරීම<br>• රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවේ වැදගත්කම | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 4.3 රජයේ පිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම තහවුරු කරයි. | • රජයේ පිස්කල් ප්‍රතිපත්ති<br>  • අරමුණු<br>  • රාජ්‍ය ආදායම් හා වියදම්<br>    • බදු<br>    • බදු වර්ග<br>      • ඍජු බදු<br>      • වක්‍ර බදු<br>    • බදු නොවන ආදායම්<br>• රජයේ පිස්කල් ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපාන ආකාරය. | 06 |
| | 4.4 රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගය යි. | • රජයේ මූල්‍ය ප්‍රතිපත්ති<br>  • අරමුණු<br>  • මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරන උපකරණ<br>    • පොලී අනුපාතිකය<br>    • සංචිත අවශ්‍යතා වෙනස් කිරීම<br>    • විවෘත වෙළෙඳපොළ කටයුතු<br>    • වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම<br>    • ණය සීමා පැනවීම<br>• රජයේ මූල්‍ය ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපාන ආකාරය | 06 |
| | 4.5 පාරිභෝගික ආරක්ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුකූලවෙමින් ව්‍යාපාර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි. | • පාරිභෝගික ආරක්ෂණය<br>  • අර්ථ දැක්වීම<br>  • අවශ්‍යතාව<br>  • වැදගත්කම<br>    • පාරිභෝගිකයන්ට<br>    • ව්‍යාපාරිකයන්ට<br>• පාරිභෝගික අයිතිවාසිකම්<br>• පාරිභෝගික වගකීම් | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 4.6 පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි. | • පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය<br>  • අරමුණු<br>  • කාර්යභාරය<br>  • වෙළෙඳාම විධිමත් කිරීම සඳහා ඇති බලතල<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>  • අරමුණු<br>  • කාර්යභාරය | 06 |
| **5. විධිමත් ව ව්‍යාපාර ආරම්භ කිරීමටත්, පවත්වා ගෙනයාමටත් ව්‍යාපාර සංවිධාන අවශ්‍ය බව තහවුරු කරයි.** | | | **45** |
| | 5.1 ව්‍යාපාර සංවිධාන හිමිකාරත්වය මත වර්ග කරයි. | • ව්‍යාපාර සංවිධාන<br>• විධිමත් සංවිධානයක මූලික ලක්ෂණ<br>• ව්‍යාපාර සංවිධාන වර්ග<br>  • පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන<br>    • කේවල ස්වාමි ව්‍යාපාර<br>    • හවුල් ව්‍යාපාර<br>    • සංස්ථාපිත සමාගම්<br>    • සමුපකාර<br>    • විශේෂිත ව්‍යාපාර<br>  • රාජ්‍ය අංශයේ ව්‍යාපාර<br>    • දෙපාර්තමේන්තු<br>    • රාජ්‍ය සංස්ථා<br>    • ප්‍රාදේශීය අධිකාරි යටතේ පවතින ව්‍යාපාර<br>    • රාජ්‍ය සමාගම් | 04 |
| | 5.2 කේවල ස්වාමි ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාර සංවිධානවල වාසි හා සීමා තුලනාත්මක ව සසඳයි. | • කේවල ස්වාමි ව්‍යාපාර සංවිධාන<br>  • අර්ථ දැක්වීම<br>  • සුවිශේෂ ලක්ෂණ<br>  • වාසි හා සීමා<br>• කේවල ස්වාමි ව්‍යාපාර ලියාපදිංචි කිරීම | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 5.3 හවුල් ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාර සංවිධානවල වාසි හා සීමා තුලනාත්මක ව සසඳයි. | • හවුල් ව්‍යාපාර<br>  • අර්ථ දැක්වීම<br>  • සුවිශේෂ ලක්ෂණ<br>  • වාසි හා සීමා<br>• හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීම | 04 |
| | 5.4 හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සඳහා හවුල් ඔප්පුවක ඇති අවශ්‍යතාව තහවුරු කරයි. | • හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර,<br>  • ඇඟවීමෙන්<br>  • වාචික ව<br>  • ලිඛිත ව<br>• හවුල් ඔප්පුව<br>  • හවුල් ඔප්පුවක වැදගත්කම<br>  • හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් වන කරුණු<br>• 1890 හවුල් ආඥා පනත හා එහි 24 වන වගන්තිය<br>• හවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් | 05 |
| | 5.5 සමුපකාර ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් ඒවායේ වාසි හා සීමා සසඳයි. | • සමුපකාර ව්‍යාපාර<br>  • අර්ථ දැක්වීම<br>  • සුවිශේෂ ලක්ෂණ<br>  • වාසි හා සීමා<br>• සමුපකාර ලියාපදිංචි කිරීම | 04 |
| | 5.6 සමුපකාර ව්‍යාපාරයේ විකාශනය විමසමින් සමුපකාරවල ප්‍රවණතා පුරෝකථනය කරයි. | • සමුපකාර ව්‍යාපාරයේ විකාශනය<br>• සමුපකාර ප්‍රතිපත්ති<br>• සමුපකාර රටේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය<br>• සමුපකාර ව්‍යාපාර ප්‍රවණතා | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 5.7 සංස්ථාපිත සමාගම්වල සුවිශේෂ ලක්ෂණ විමසයි. | • සංස්ථාපිත සමාගම්<br>  • අර්ථ දැක්වීම<br>  • සුවිශේෂ ලක්ෂණ<br>  • වාසි හා සීමා<br>• සමාගම් සංස්ථාපනය කිරීම | 04 |
| | 5.8 විවිධ වර්ගයේ සමාගම්වල සුවිශේෂ ලක්ෂණ සන්සන්දනය කරයි. | • සංස්ථාපිත සමාගම් වර්ග<br>  • සී/ස සමාගම්<br>    • සී/ස පෞද්ගලික සමාගම්<br>    • සී/ස පොදු සමාගම්<br>    • සී/ස අක්වෙරළ සමාගම්<br>  • සී/රහිත සමාගම්<br>  • ඇපයෙන් සීමිත සමාගම්<br>  • විදේශීය සමාගම්<br>• සංස්ථාපිත සමාගම් වර්ග සැසඳීමේ නිර්ණායක<br>  • සාමාජික සංඛ්‍යාව<br>  • වගකීම<br>  • ප්‍රාග්ධන සම්පාදනය<br>    • කොටස්<br>    • ණයකර<br>  • පාලනය හා කළමනාකරණය | 05 |
| | 5.9 වරලත් ව්‍යාපාරවල සුවිශේෂ ලක්ෂණ විමසමින් ඒවායේ වාසි හා සීමා සන්සන්දනය කරයි. | • වරලත් ව්‍යාපාර<br>  • වරලත්කරු<br>  • වරලත්ලාභියා<br>  • වරලත්කරු වරලත්ලාභියාට සපයන පහසුකම්<br>  • වරලත් ව්‍යාපාර වර්ග<br>  • වරලත් ව්‍යාපාරවල වාසි හා සීමා | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 5.10රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසමින් ඒවායේ වැදගත්කම පෙන්වා දෙයි. | • ව්‍යාපාර කටයුතු රජය යටතේ පවත්වාගෙන යාමට හේතු<br>• රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන<br>  • රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල<br>  • රජයේ දෙපාර්තමේන්තු<br>  • ප්‍රාදේශීය අධිකාරි යටතේ පවතින ව්‍යාපාර<br>• රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ<br>• පෞද්ගලීකරණය හා ඒ ආශ්‍රිත විවාදිත | 05 |
| **6. ආර්ථික හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවසාය -කත්වයෙහි දායකත්වය පෙන්වා දෙයි.** | | | 35 |
| | 6.1 ව්‍යවසායකත්වයේ වැදගත්කම හා ප්‍රතිලාභ අධ්‍යයනයෙන් ව්‍යවසායකයකුවීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි. | • ව්‍යවසායකත්වය<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>• ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ<br>  • පුද්ගල<br>  • සමාජයීය හා ආර්ථික<br>• ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය<br>• ව්‍යවසායකත්වයේ ප්‍රවණතා | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 6.2 ව්‍යවසායකයන් බිහිවීමට පසුබිම් වූ හේතු අධ්‍යයනය කරයි. | • ව්‍යවසායකයා<br>• ව්‍යවසායකයා බිහිවීමේ පසුබිම්<br>  • ස්වයං නිර්මාණ කෙරෙහි යොමුවීම<br>  • පවුල් පසුබිම<br>  • සමාජ ආර්ථික පසුබිම<br>  • අධ්‍යාපනය හා පුහුණුව<br>  • සමාජයීය ගැටලු | 06 |
| | 6.3 ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය කර ගනිමින් ව්‍යවසායකයකු ලෙස කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | • ව්‍යවසායකත්ව නිපුණතා<br>  • නිර්මාණශීලීත්වය<br>  • ආරම්භන හැකියාව (Initiativeness)<br>  • අවදානම් දැරීම<br>  • අවස්ථා හඳුනා ගැනීම<br>  • සම්පත් සංවිධානය<br>  • නායකත්වය<br>  • ජාල සම්බන්ධතා<br>  • දැක්ම (Vision)<br>  • ස්වාධීන බව<br>  • කැපවීම<br>  • ආත්ම විශ්වාසය (Self confidence)<br>  • ස්වයං අවබෝධය (Self awareness)<br>  • අභිලාෂ මුදුන් පමුණුවා ගැනීම (Achieving goals)<br>  • සුභවාදී බව (Optimistic)<br>  • නම්‍යශීලී බව (Flexibility)<br>  • දරා ගැනීමේ හැකියාව (Bearability)<br>  • පහසුවෙන් ප්‍රකෘති තත්ත්වයට පත්වීම (Resilience)<br>  • සංගතතාව (Consistency)<br>  • සමාජ හිතකාමී බව (Social Friendly)<br>  • පරිසර හිතවාදී බව (Ecofriendly) | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | | • ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගැනීමේ මාර්ග<br>  • ස්වයං ඇගයීම<br>  • පුහුණුව<br>  • අධ්‍යාපනය<br>  • අත්දැකීම්වලින් ඵල ලැබීම | |
| | 6.4 ආර්ථික සංවර්ධනය සඳහා කුඩා ව්‍යාපාරවල දායකත්වය විමසයි. | • කුඩා ව්‍යාපාර<br>  • අර්ථ දැක්වීම<br>  • ලක්ෂණ<br>  • වැදගත්කම<br>• ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර අතර සම්බන්ධතාව<br>• කුඩා ව්‍යාපාරිකයින් සැලකිලිමත් විය යුතු කරුණු<br>  • ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී<br>  • ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී<br>• කුඩා ව්‍යාපාර අසාර්ථකවීමට හේතු හා සාර්ථක කර ගත හැකි මාර්ග | 06 |
| | 6.5 කුඩා ව්‍යාපාර සාර්ථක කර ගැනීම සඳහා ඇති දිරිගැන්වීම් සොයා බලයි. | • කුඩා ව්‍යාපාර දිරිගැන්වීමට රජය ගෙන ඇති පියවර<br>  • මූල්‍යමය<br>  • මූල්‍යමය නොවන<br>• දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා පුද්ගලයන් | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • ලබා දෙන දිරිගැන්වීම් වර්ග<br>  • උපදේශන සේවා<br>  • පර්යේෂණ හා තාක්ෂණික සේවා<br>  • මූල්‍ය පහසුකම්<br>  • අලෙවි පහසුකම්<br>  • යටිතල පහසුකම් | |
| | 6.6 කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ඇති විශේෂ ව්‍යාපෘති විමසා බලයි. | • ආධාර දෙන ව්‍යාපෘති<br>  • දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති<br>  ***නිදසුන්***<br>    • සුවන<br>    • සුමදි<br>    • සහන්යා<br>    • නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය<br>    • ගැමි පුබුදුව වැඩ සටහන<br>    • සණස ණය ව්‍යාපෘතිය<br>    • සමුපකාර ග්‍රාමීය බැංකු ණය<br>    • සමෘද්ධි සංවර්ධන ණය යෝජනා ක්‍රමය<br>    • ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය<br>  • වෙනත් කාලීන ව්‍යාපෘති | 06 |
| **7. ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතනවලින් වන දායකත්වය අගය කරයි.** | | | 40 |
| | 7.1 ගනුදෙනු පහසු කර ගැනීම සඳහා මුදලේ අවශ්‍යතාව තහවුරු කරයි. | • මුදල්<br>  • අර්ථ දැක්වීම<br>  • විකාශනය<br>  • කාර්ය<br>  • මුදල්වල ලක්ෂණ<br>  • වර්ග<br>    • ව්‍යවහාර මුදල්<br>    • බැංකු මුදල්<br>    • ආසන්න මුදල්<br>    • විද්‍යුත් මුදල් | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.2 ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට හා වර්ධනයට දායකවන ආකාරය අගය කරයි. | • ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය<br>• බැංකු අංශය<br>• මහ බැංකුව<br>• බලපත්‍රලාභී වාණිජ බැංකු<br>• බලපත්‍රලාභී විශේෂිත බැංකු<br>• තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන<br>• ලියාපදිංචි මූල්‍ය සමාගම්<br>• සමුපකාර ග්‍රාමීය බැංකු<br>• සකසුරුවම් හා ණයදෙන සමුපකාර සමිති<br>• අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන<br>• විශේෂිත කල්බදු සමාගම්<br>• ප්‍රාථමික වෙළෙඳුන්<br>• වණික් බැංකු<br>• කොටස් තැරැව්කාර සමාගම්<br>• ඒකක භාර<br>• ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්<br>• ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන<br>• ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන<br>• රක්ෂණ සමාගම්<br>• සේවක අර්ථසාධක අරමුදල<br>• සේවක භාරකාර අරමුදල<br>• අනෙකුත් අර්ථසාධක අරමුදල්<br>• රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්<br>• රටක මූල්‍ය ආයතන පද්ධතිය ව්‍යාපාර සේවාවක් ලෙස වැදගත් වන ආකාරය<br>**(ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව-2007 ඇසුරෙනි)** | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.3 වාණිජ බැංකු පවත්වාගෙන යන විවිධ තැන්පතු සහ සපයන ණය ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට හා වර්ධනයට කරන බලපෑම පෙන්වා දෙයි. | • වාණිජ බැංකු තැන්පතු වර්ග<br>  • ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු)<br>  • ඉතිරිකිරීම් ගිණුම්<br>  • ස්ථාවර තැන්පතු<br>• විවිධ තැන්පතු වර්ග ව්‍යාපාරිකයකුට වැදගත් වන ආකාරය<br>• වාණිජ බැංකු සපයන ණය<br>  • අයිරා<br>  • ණය<br>    • ව්‍යාපාරික ණය<br>    • පාරිභෝගික ණය | 06 |
| | 7.4 වාණිජ බැංකු සපයන අනෙකුත් සේවා ව්‍යාපාරවල ක්‍රියාකාරීත් -වයට ඇති කරන බලපෑම පෙන්වා දෙයි. | • වාණිජ බැංකුවල අනෙකුත් සේවා<br>  • නියෝජිත සේවා සැපයීම<br>  • කල්බදු සේවා<br>  • හෝම් බැංකින්<br>  • දුරකථන බැංකු සේවය (Tele Banking)<br>  • උකස් සේවා<br>  • සුරක්ෂිතාගාර පහසුකම්<br>  • විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම<br>  • ණයපත් සේවාව<br>  • මුදල් ප්‍රේෂණ කටයුතු<br>  • සංචාරක චෙක්පත් නිකුත් කිරීම<br>  • ස්වයංක්‍රීය බැංකු සේවා<br>  • විද්‍යුත් බැංකු සේවා (E- Banking)<br>  • ණයවර ලිපි නිකුත් කිරීම<br>  • වෙනත් සේවා<br>• වාණිජ බැංකු අනෙකුක් සේවා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.5 චෙක්පත් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය පෙන්වා දෙයි. | • චෙක්පත<br>• චෙක්පත් වර්ග<br>  • විධාන චෙක්පත්<br>  • ධාරක (හාරක) චෙක්පත්<br>• චෙක්පතකට සම්බන්ධ පාර්ශ්ව<br>  • අණකරු<br>  • අණලදු<br>  • ආදායකයා<br>• චෙක්පතක් ලිවීමේ දී සැලකිය යුතු කරුණු<br>• චෙක්පත් රේඛනය<br>  • සාමාන්‍ය රේඛනය<br>  • විශේෂ රේඛනය<br>• චෙක්පත් පිටසන් කිරීම<br>• චෙක්පතක් අගරු වීම | 06 |
| | 7.6 විද්‍යුත් මුදල් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය පෙන්වා දෙයි. | • විද්‍යුත් මුදල්<br>  • විද්‍යුත් මුදල් වර්ග<br>  • විද්‍යුත් මුදල් හා සම්බන්ධ පාර්ශ්ව<br>  • විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ<br>  • විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි | 05 |
| | 7.7 ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය විමසා බලයි. | • ශ්‍රී ලංකා මහ බැංකුව<br>  • අරමුණු<br>  • කාර්ය<br>  • ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය ව්‍යාපාර සාර්ථකත්වයට බලපෑම | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| **8. ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.** | | | **20** |
| | 8.1 ව්‍යාපාරවල පැවැත්මට හේතු වන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි. | • රක්ෂණය<br>  • අර්ථ දැක්වීම<br>• අවදානම<br>  • අර්ථ දැක්වීම<br>  • රක්ෂණය කළ හැකි අවදානම්<br>  • රක්ෂණය කළ නොහැකි අවදානම්<br>• රක්ෂණයේ අවශ්‍යතාව<br>• රක්ෂණ ගිවිසුම<br>  • රක්ෂණ ගිවිසුමට සම්බන්ධ පාර්ශ්ව<br>  • රක්ෂණ ඔප්පුව | 05 |
| | 8.2 රක්ෂණයේ ප්‍රායෝගික භාවිතය සඳහා ඉවහල් වන රක්ෂණ මූලධර්ම විමර්ශනය කරයි. | • රක්ෂණ මූලධර්ම<br>  • රක්ෂ්‍ය හිමිකම<br>  • උපරිම විශ්වාසය<br>  • හානිපූරණය<br>  • ආදේශනය<br>  • දායකත්වය<br>  • ආසන්නතම හේතුව | 05 |
| | 8.3 ව්‍යාපාරවල විවිධ අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පු වර්ග පරීක්ෂා කරයි. | • රක්ෂණ වර්ගීකරණය<br>  • ජීවිත රක්ෂණය<br>  • සාමාන්‍ය රක්ෂණය<br>    • ගිනි රක්ෂණය<br>    • සොර බිය රක්ෂණය<br>    • ස්වාභාවික විපත් රක්ෂණය<br>    • සමුද්‍රීය රක්ෂණය<br>    • මෝටර් රථ රක්ෂණය | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • සේවා යෝජක වගකීම් රක්ෂණය<br>• මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය<br>• මාර්ගස්ථ මුදල් රක්ෂණය | |
| | 8.4 රක්ෂණ ව්‍යාපාරයේ පැවැත්මට දායක වන ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළෙඳපොළෙහි පාර්ශ්වකරුවන් සොයා බලයි. | • රක්ෂණ වෙළෙඳපොළ සංයුතිය<br>  • ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය<br>  • රක්ෂණ සමාගම්<br>  • රක්ෂණ තැරැව්කරුවන්<br>  • රක්ෂණ නියෝජිතයින්<br>• ප්‍රාරක්ෂකයන්<br>• ප්‍රතිරක්ෂකයන් | 05 |
| 9. ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය සඳහා ප්‍රවාහනය සඵලදායීව යොදා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි. | 9.1 ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය සඳහා යොදා ගත හැකි විවිධ ප්‍රවාහන ක්‍රමවල වාසි හා සීමා සන්සන්දනය කරයි. | • ප්‍රවාහනය<br>• ප්‍රවාහන පද්ධතිය<br>• ප්‍රවාහන පද්ධතියක මූලිකාංග<br>  • මාර්ගය<br>  • මාධ්‍යය<br>  • බලය<br>  • පර්යන්තය<br>• විවිධ ප්‍රවාහන ක්‍රම<br>  • මහාමාර්ග ප්‍රවාහනය<br>  • දුම්රිය මාර්ග ප්‍රවාහනය<br>  • ජල මාර්ග ප්‍රවාහනය<br>  • ගුවන් මාර්ග ප්‍රවාහනය<br>• විවිධ ප්‍රවාහන ක්‍රමවල වාසි හා සීමා<br>• ප්‍රවාහනයේ වැදගත්කම | 10<br>05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | 9.2 ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග විමසමින් සඵලදායී ප්‍රවාහන මාධ්‍ය තෝර ගනියි. | • ප්‍රවාහන ක්‍රමයක්/ මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු<br>• කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග<br>• ප්‍රවාහනයේ දී භාවිත වන ලියවිලි<br>• ප්‍රවාහනයේ නව ප්‍රවණතා | 05 |
| **10.ව්‍යාපාර සාර්ථකත්වය සඳහා සන්නිවේදනය සඵලදායීව යොදා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කරයි.** | 10.1 සන්නිවේදන ක්‍රියාවලියක සඵලදායකත්වයට තුඩුදෙන සාධක විමසයි. | • සන්නිවේදනය<br>• සන්නිවේදනයේ වැදගත්කම<br>  • ව්‍යාපාරික කටයුතු සඳහා<br>  • සමාජයීය කටයුතු සඳහා<br>• සන්නිවේදන ක්‍රියාවලිය<br>• සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග<br>  • යවන්නා<br>  • පණිවුඩය<br>  • මාධ්‍යය<br>  • ලබන්නා<br>  • ප්‍රතිචාරය<br>  • ප්‍රතිපෝෂණය<br>• සඵලදායී සන්නිවේදනයක ගුණාංග<br>  • නිවැරදි බව<br>  • සංක්ෂිප්ත බව<br>  • පූර්ණ බව<br>  • පැහැදිලි බව<br>  • ආචාරශීලී බව<br>  • නිශ්චිත බව<br>  • සැලකිලිමත් බව (අවධානීය බව)<br>  • පිරිවැය අවම බව<br>  • වේගවත් බව | 10<br><br>05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 10.2විවිධ සන්නිවේදන ක්‍රම විමසමින් සඵලදායී සන්නිවේදන සේවා තෝරා ගනියි. | • සන්නිවේදන ක්‍රම<br>  • වාචික<br>  • ලිඛිත<br>  • සංඥා හා සංකේත<br>• විද්‍යුත් සන්නිවේදනය<br>• අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය<br>• සඵලදායී සන්නිවේදනයට ඇති බාධා හා ඒවා පිටුදැකීම | 05 |
| **11. නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායකවන අයුරු විමසයි.** | | | 40 |
| | 11.1 වෙළෙඳාමේ ප්‍රභේද පිළිබඳ ව සැලකිලිමත්වෙමින් සිල්ලර වෙළෙඳාම සිදුවන අයුරු විමසයි. | • වෙළෙඳාම<br>  • අර්ථ දැක්වීම<br>  • බෙදාහැරීමේ ක්‍රියාවලිය<br>  • වෙළෙඳ අතරමැදියන්<br>• වෙළෙඳාමේ ප්‍රභේද<br>  • දේශීය<br>    • තොග<br>    • සිල්ලර<br>  • විදේශීය<br>    • ආනයන<br>    • අපනයන<br>• සිල්ලර වෙළෙඳාම<br>  • අර්ථ දැක්වීම<br>  • ලක්ෂණ<br>  • සිල්ලර වෙළෙඳුන්ගෙන් ඉටුවන සේවා<br>    • නිෂ්පාදකයාට<br>    • තොග වෙළෙන්දාට<br>    • පාරිභෝගිකයාට | 06 |
| | 11.2දේශීය වෙළෙඳාමේ උන්නතිය පිළිබඳව සැලකිලිමත් වෙමින් අවශ්‍යතා සපුරා ගැනීමට උචිත සිල්ලර වෙළෙඳසල් තෝරයි. | • සිල්ලර වෙළෙඳසල් වර්ග<br>  • සංචාරක සිල්ලර වෙළෙඳසල්<br>  • ස්ථාවර සිල්ලර වෙළෙඳසල්<br>• සිල්ලර වෙළෙඳාමේ නව ප්‍රවණතා | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 11.3 තොග වෙළෙඳාම සිදුවන අයුරු විමසයි. | • තොග වෙළෙඳාම<br>  • අර්ථ දැක්වීම<br>  • ලක්ෂණ<br>  • තොග වෙළෙඳුන්ගෙන් ඉටුවන සේවා<br>    • නිෂ්පාදකයාට<br>    • සිල්ලර වෙළෙන්දාට<br>  • නියෝජිතයින්<br>• වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා සීමා | 06 |
| | 11.4 විදේශ වෙළෙඳාම හා ඒ ආශ්‍රිත ප්‍රතිලාභ හා බාධක විමසයි. | • විදේශ වෙළෙඳාම<br>  • අර්ථ දක්වීම<br>  • පදනම් වූ සාධක<br>  • ප්‍රභේද<br>    • ආනයන<br>    • අපනයන<br>    • අන්තරාල<br>  • ප්‍රතිලාභ<br>• නිදහස් වෙළෙඳාම<br>  • අර්ථ දක්වීම<br>  • නිදහස් වෙළෙඳාමට ඇති බාධක<br>    • තීරු බදු<br>    • තීරු බදු නොවන | 06 |
| | 11.5 ආනයන හා අපනයන ක්‍රියාපටිපාටිය විමසමින් විදේශ වෙළෙඳාමට ප්‍රවේශවීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • ආනයන හා අපනයන ක්‍රියා පටිපාටිය<br>  • භාවිත වන ලියවිලි හා ක්‍රම පිළිවෙත්<br>  • මුදල් ගෙවීම<br>    • බැංකු අණකරය<br>    • ණයවර ලිපිය<br>    • විද්‍යුත් ගෙවීම් ක්‍රම<br>    • විදේශ තැපැල් හා ටෙලෙක්ස් පැවරුම් | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 11.6 වෙළෙඳ කලාපවල හා ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරීත්වය විදේශ වෙළෙඳාමේ උන්නතියට දායක වන ආකාරය විමර්ශනය කරයි. | • වෙළෙඳ කලාප (Trade Blocs)<br>***නිදසුන්***<br>• යුරෝපීය සංගමය<br>• ආසියාන් සංගමය<br>• සාර්ක් සංවිධානය<br>• උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA)<br>• සංවිධාන<br>***නිදසුන්***<br>• ලෝක වෙළෙඳ සංවිධානය (WTO)<br>• ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (IBRD ලෝක බැංකුව)<br>• ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)<br>• රටවල් අටේ කණ්ඩායම (G8)<br>• වෙළෙඳ ගිවිසුම්/ සංවිධාන (කාලීන ව ඇති වන)<br>• වෙළෙඳ ගිවිසුම් විදේශ වෙළෙඳාමට ඇති කරන බලපෑම<br>• විදේශ වෙළෙඳාමේ නව ප්‍රවණතා | 06 |
| | **11.7** විද්‍යුත් වාණිජ්‍ය වෙළෙඳාමේ උන්නතියට දායක වන ආකාරය පෙන්වා දෙයි. | • විද්‍යුත් වෙළෙඳාම<br>• අර්ථ දැක්වීම<br>• ක්‍රියා පටිපාටිය<br>• වාසි හා සීමා<br>• විද්‍යුත් වෙළෙඳාම සිදුවන ආකාර<br>• ව්‍යාපාරිකයාගෙන් ව්‍යාපාරිකයාට (B2B)<br>• ව්‍යාපාරිකයාගෙන් පාරිභෝගිකයාට (B2C)<br>• පාරිභෝගිකයාගෙන් පාරිභෝගිකයාට (C2C)<br>• රජයෙන් පුරවැසියන්ට (G2C) | 05 |
| | | | 310 |

## 3.2 - 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 12. සංවිධානයක සමස්ත අරමුණු ඉටුකර ගැනීම සඳහා කළමනා- -කරණයේ අවශ්‍යතා හා වැදගත්කම පෙන්වා දෙයි. | | | 45 |
| | 12.1 කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම තහවුරු කර ගැනීමට කළමනාකරණ ක්‍රියාවලිය විමසයි. | • කළමනාකරණය<br>• කළමනාකරණ ක්‍රියාවලිය<br>  • සැලසුම්කරණය<br>  • සංවිධානකරණය<br>  • මෙහෙයවීම<br>  • පාලනය<br>• කාර්යක්ෂමතාව හා සඵලදායකත්වය<br>• කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම | 04 |
| | 12.2 කළමනාකරුවන්ගේ කාර්යභාරය හඳුනා ගැනීමට විවිධ කළමනාකරණ භූමිකා විශ්ලේෂණය කරයි. | • කළමනාකරු<br>• කළමනාකරුගේ කාර්යභාරය<br>• කළමනාකරුවකුගේ භූමිකා<br>  • අන්තර් පුද්ගල භූමිකාව<br>  • තොරතුරු භූමිකාව<br>  • තීරණ ගැනීමේ භූමිකාව | 04 |
| | 12.3 විවිධ කළමනාකරණ මට්ටම්වලට අදාළ ව අවශ්‍ය වන කළමනාකරණ හැකියා විමසයි. | • විවිධ කළමනාකරණ මට්ටම්<br>  • අග්‍ර මට්ටමේ කළමනාකරුවන්<br>  • මධ්‍ය මට්ටමේ කළමනාකරුවන්<br>  • පළමුවන මට්ටමේ කළමනාකරුවන්<br>• කළමනාකරුවකු තුළ තිබිය යුතු කුසලතා<br>  • සංකල්පනාත්මක කුසලතා<br>  • මානව කුසලතා (අන්තර් පුද්ගල සම්බන්ධතා)<br>  • තාක්ෂණික කුසලතා | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 12.4 සාර්ථකව තීරණ ගැනීමට හා ගැටලු විසඳීමට විධිමත් ක්‍රමයක් අනුගමනය කරයි. | • සැලසුම්කරණය<br>  • පුරෝකථනය<br>  • සැලැස්ම<br>• තීරණ ගැනීම හා ගැටලු විසඳීම පිළිබඳ සංකල්පය<br>• තීරණ ගැනීමේ හා ගැටලු විසඳීමේ ක්‍රියාවලිය<br>  • ගැටලුව හඳුනා ගැනීම<br>  • විකල්ප ගොඩනැගීම<br>  • විකල්ප ඇගයීම<br>  • හොඳම විකල්පය තේරීම<br>  • ක්‍රියාත්මක කිරීම | 04 |
| | 12.5 අරමුණු සඵලදායී ව ළඟාකර ගැනීම සඳහා සැලසුම් සකසයි. | • සැලසුම්කරණ ක්‍රියාවලිය සහ තීරණ ගැනීම.<br>• සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර<br>  • පරිසරය විශ්ලේෂණය<br>  • ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනා ගැනීම.<br>  • දැක්ම, මෙහෙවර, අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කිරීම.<br>  • උපාය මාර්ග හඳුනා ගැනීම.<br>  • සැලසුම් ක්‍රියාත්මක කිරීම<br>  • සාර්ථකත්වය මැන බැලීම හා පාලනය<br>• සැලසුම්කරණ මූලධර්ම<br>• සැලසුම්කරණයේ වැදගත්කම<br>• සැලසුම්කරණයේ දී පැන නගින ගැටලු හා සීමා | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 12.6 සාර්ථක කළමනාකරණයක් සඳහා සම්පත් මනාව සංවිධානය කිරීමේ අවශ්‍යතාව තහවුරු කරයි. | • සංවිධානකරණය<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>• සංවිධානකරණයේ පියවර<br>  • කාර්ය හඳුනා ගැනීම<br>  • වැඩ බෙදීම<br>  • දෙපාර්තමේන්තුකරණය<br>  • අධිකාරිය හා වගකීම් පැවරීම<br>  • වැඩ කිරීමේ ප්‍රමිති ඇති කිරීම<br>  • සම්පත් බෙදා දීම.<br>  • සමායෝජනය | 04 |
| | 12.7 සාර්ථක සංවිධානකරණයක් සඳහා අවධානය යොමු කළ යුතු සංකල්ප විග්‍රහ කරයි. | • අණකිරීමේ ඒකීයතාව/නියෝගදීමේ දාමය<br>• පාලන පථය/විතස්තිය<br>• බලය හා අධිකාරය<br>  • මධ්‍යගතකරණය<br>  • විමධ්‍යගතකරණය<br>• සංවිධාන ව්‍යුහය<br>• සංවිධාන සටහන | 04 |
| | 12.8 මෙහෙයවීමේ ක්‍රියාවලිය සඳහා තිබිය යුතු නායකත්ව ලක්ෂණ ප්‍රදර්ශනය කරයි. | • මෙහෙයවීම් ක්‍රියාවලිය<br>  • නායකත්වය<br>  • අභිප්‍රේරණය<br>  • සන්නිවේදනය<br>• මෙහෙයවීම් ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස නායකත්වය<br>  • අර්ථ දැක්වීම<br>  • වැගත්කම<br>  • නායකත්ව ශෛලි<br>  • නායකත්ව ගුණාංග | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 12.9 මෙහෙයවීම් ක්‍රියාවලිය සඵල කර ගැනීමට උචිත අභිප්‍රේරණ ක්‍රම යෝජනා කරයි. | • මෙහෙයවීම් ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස අභිප්‍රේරණය<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>  • අභිප්‍රේරණ ක්‍රම<br>    • මූල්‍යමය<br>    • මූල්‍යමය නොවන | 04 |
| | 12.10 මෙහෙයවීම් ක්‍රියාවලිය සඵල කර ගැනීමට මනා සන්නිවේදනය ඉවහල් වන ආකාරය පෙන්වා දෙයි. | • මෙහෙයවීම් ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස සන්නිවේදනය<br>  • අවශ්‍යතාව<br>  • වැදගත්කම<br>• සන්නිවේදනය සිදුවන ආකාර<br>  • ඉහළ සිට පහළට සන්නිවේදනය<br>  • පහළ සිට ඉහළට සන්නිවේදනය<br>  • තිරස් සන්නිවේදනය<br>  • විධිමත් සන්නිවේදනය<br>  • අවිධිමත් සන්නිවේදනය | 04 |
| | 12.11 අපේක්ෂිත අරමුණු ඉටු වූ බව තහවුරු කර ගැනීමට පාලනයේ අවශ්‍යතාව විමසයි. | • පාලනය<br>• පාලන ක්‍රියාවලියට අදාළ කාර්ය<br>  • ප්‍රමිති ස්ථාපිත කිරීම<br>  • කාර්යඵල මැනීම<br>  • විචලන හඳුනා ගැනීම<br>  • නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම<br>• පාලන ශිල්පීය ක්‍රම<br>  • වැළැක්වීම<br>  • නිවැරදි කිරීම<br>  • ක්‍රියාවලි පාලනය<br>• පාලනයේ වැදගත්කම | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| **13. ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මෙහෙයුම් කළමනාකරණයේ දායකත්වය අගයයි.** | | | 45 |
| | 13.1ආයතනික හා පාරිභෝගික අරමුණු ඉටුවන පරිදි මෙහෙයුම් සැලසුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • මෙහෙයුම් සංකල්පය<br>• මෙහෙයුම් කළමනාකරණය<br>  • අර්ථ දැක්වීම<br>  • කාර්ය<br>• පරිවර්තන ක්‍රියාවලියක් ලෙස මෙහෙයුම් කටයුතු (Operations as a transformation process)<br>  • යෙදවුම්<br>  • ක්‍රියාවලිය<br>  • නිමැවුම්<br>• එකතු කළ අගය (value added)<br>• නිෂ්පාදන සැලසුම්කරණය<br>  • කෙටිකාලීන නිෂ්පාදන වැඩසටහන් සැකසීම.<br>  • දිගුකාලීන නිෂ්පාදන වැඩසටහන් සැකසීම.<br>• පර්යේෂණ හා සංවර්ධන කටයුතු | 05 |
| | 13.2 විවිධ නිෂ්පාදන ක්‍රම විමසා බලමින් යෝග්‍ය නිෂ්පාදන ක්‍රමයක් යෝජනා කරයි. | • නිෂ්පාදන ක්‍රම<br>  • අර්ථ දැක්වීම<br>  • වර්ග කිරීම<br>    • ඇණවුමට නිෂ්පාදනය<br>      • අර්ථ දැක්වීම<br>      • හිතකර හා අහිතකර ලක්ෂණ | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • කාණ්ඩ නිෂ්පාදනය<br>• අර්ථ දැක්වීම<br>• හිතකර හා අහිතකර ලක්ෂණ<br>• ප්‍රවාහ නිෂ්පාදනය<br>• අර්ථ දැක්වීම<br>• හිතකර හා අහිතකර ලක්ෂණ<br>• නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීම<br>• නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු<br>• කම්හල් පිරියත සැලැස්ම | |
| | 13.3 මුළු ආදායම හා මුළු නිෂ්පාදන පිරිවැය ගළපමින් සමච්ඡේදන ලක්ෂ්‍යය ගණනය කරයි. | • මුළු පිරිවැය<br>• ස්ථාවර පිරිවැය<br>• විචල්‍ය පිරිවැය<br>• මුළු ආදායම<br>• සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහය<br>• සමීකරණ ඇසුරින්<br>• ප්‍රස්තාර ඇසුරින්<br>• සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහයේ වාසි | 05 |
| | 13.4 ද්‍රව්‍ය මිල දී ගැනීම සාර්ථක කර ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු පෙන්වා දෙයි. | • මිලදී ගැනීම<br>• ද්‍රව්‍ය<br>• සේවා<br>• මිල දී ගැනීමේ ක්‍රියාවලිය<br>• මිලට ගැනීමේ දී සැලකිය යුතු කරුණු | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 13.5 තොග පාලනය සඳහා උචිත ක්‍රම තීරණය කරයි. | • තොග පාලනය<br>  • අර්ථ දැක්වීම<br>  • අවශ්‍යතාව<br>  • තොග පාලන ක්‍රම<br>    • තොග මට්ටම නිශ්චය කිරීමේ ක්‍රමය<br>    • ABC විශ්ලේෂණය<br>    • ද්විත්ව භාජන ක්‍රමය<br>    • පරිගණක වැඩසටහන්<br>    • අඛණ්ඩ තොග වාර්තා කිරීමේ ක්‍රමය<br>• JIT ක්‍රමය | 05 |
| | 13.6 ප්‍රශස්ත තොගයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තොග මට්ටම් නිශ්චය කරයි. | • තොග මට්ටම්<br>  • උපරිම තොග මට්ටම<br>  • අවම තොග මට්ටම<br>  • යළි ඇණවුම් මට්ටම<br>• තොග මට්ටම් ගණනය කිරීම<br>• තොග මට්ටම් ප්‍රස්තාරිකව දැක්වීම | 05 |
| | 13.7 තොග පිරිවැය පිළිබඳ ව සැලකිලිමත්වෙමින් ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරයි. | • මුළු තොග පිරිවැය<br>  • තොග ඇණවුම් කිරීමේ පිරිවැය<br>  • තොග පවත්වාගෙන යාමේ පිරිවැය<br>• ආර්ථික ඇණවුම් ප්‍රමාණය<br>  • ගණනය කිරීම<br>    • ප්‍රස්තාරික ක්‍රමය<br>    • වීජීය ක්‍රමය | 05 |
| | 13.8 නිමැවුම්වල ගුණාත්මක බව තහවුරු කර ගැනීම සඳහා යෝග්‍ය තත්ත්ව පාලන ක්‍රම විමසයි. | • ගුණත්වය<br>• සමස්ත ගුණත්ව කළමනාකරණය<br>• තත්ත්ව පාලනය/ ගුණත්ව පාලනය<br>• තත්ත්ව පාලනයේ වැදගත්කම<br>• තත්ත්ව පාලන ශිල්ප ක්‍රම | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 13.9 එලදායීතාව වැඩිකර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි. | • එලදායිතාව<br>  • වැදගත්කම<br>  • මැනීම<br>  • වර්ධනය කර ගත හැකි ක්‍රම<br>• නව තාක්ෂණ ශිල්ප ක්‍රම<br>• නව තාක්ෂණය යොදා ගැනීමේ ප්‍රතිලාභ<br>• නව තාක්ෂණය යොදා ගැනීමේ ගැටලු | 05 |
| **14. ව්‍යාපාර සාර්ථකත්වය සඳහා අලෙවි කළමනාකරණයේ දායකත්වය අගය යි.** | | | 45 |
| | 14.1 අලෙවිකරණයෙන් ප්‍රශස්ත ඵල ලැබීමට අලෙවිකරණයට පදනම් වූ මූලික සංකල්ප විමසයි. | • අලෙවිකරණය<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>• අලෙවිකරණ හර සංකල්ප<br>  • අවශ්‍යතා, වුවමනා හා ඉල්ලුම<br>  • නිෂ්පාදිත<br>  • වටිනාකම, තෘප්තිය හා ගුණත්වය<br>  • හුවමාරුව, ගනුදෙනු හා සම්බන්ධතා<br>  • වෙළෙඳපොළ | 04 |
| | 14.2 අලෙවිකරණ දර්ශනයේ විකාශනය විමසමින් යෝග්‍ය අලෙවිකරණ දර්ශනය තෝරයි. | • අලෙවිකරණ දර්ශන (සංකල්ප)<br>• අලෙවිකරණ දර්ශනයේ විකාශනය<br>  • නිෂ්පාදන සංකල්පය<br>  • නිෂ්පාදිත සංකල්පය<br>  • විකුණුම් සංකල්පය<br>  • අලෙවිකරණ සංකල්පය<br>  • ගනුදෙනුකරු සංකල්පය<br>  • සමාජයීය අලෙවිකරණ සංකල්පය<br>  • සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 14.3 නිෂ්පාදිත ඉදිරිපත් කළ යුතු පාරිභෝගික කණ්ඩය තීරණය කරයි. | • වෙළෙඳපොළ<br>• වෙළෙඳපොළ ඛණ්ඩනය<br>  • අර්ථ දැක්වීම<br>  • වෙළෙඳපොළ ඛණ්ඩනයේ ප්‍රතිලාභ<br>  • පාරිභෝගික වෙළෙඳපොළ ඛණ්ඩනයේ පදනම්<br>  • ඵලදායී වෙළෙඳපොළ ඛණ්ඩනයක් සඳහා තිබිය යුතු අවශ්‍යතා<br>• ඉලක්ක වෙළෙඳපොළ | 04 |
| | 14.4 අලෙවිකරණ මිශ්‍රය හා එහි විචල්‍යය ව්‍යාපාරිකයාගේ හා ගනුදෙනුකරුගේ දෘෂ්ඨියෙන් විමසයි. | • අලෙවිකරණ මිශ්‍රය ව්‍යාපාරිකයාගේ දෘෂ්ඨියෙන් ($4P_s$)<br>  • නිෂ්පාදිතය(Product)<br>  • මිල (Price)<br>  • ස්ථානය (Place)<br>  • ප්‍රවර්ධනය (Promotion)<br>• සේවා සඳහා අලෙවිකරණ මිශ්‍රය ($7P_s = 4P_s + 3P_s$)<br>  • අලෙවි සේවකයා (People)<br>  • ක්‍රියාවලිය (Process)<br>  • භෞතික වටපිටාව (Physical evidence)<br>• අලෙවිකරණ මිශ්‍රය ගනුදෙනුකරු දෘෂ්ටියෙන් ($4C_s$)<br>  • පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා (Consumer needs and wants)<br>  • පිරිවැය (Cost)<br>  • පහසුව (Convenience)<br>  • සන්නිවේදනය (Communication) | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 14.5 පාරිභෝගිකයා තෘප්තිමත් කළ හැකි නිෂ්පාදිතයක් තීරණය කරයි. | • නිෂ්පාදිතය<br>  • භාණ්ඩ<br>  • සේවා<br>• නිෂ්පාදිතයක මට්ටම්<br>  • හර ප්‍රතිලාභ<br>  • මූලික නිෂ්පාදිතය<br>  • අපේක්ෂිත නිෂ්පාදිතය<br>  • වැඩි දියුණු කළ නිෂ්පාදිතය<br>  • විභව නිෂ්පාදිතය | 04 |
| | 14.6 නිෂ්පාදන සඳහා උචිත සන්නමක් හා වෙළෙඳ ලකුණක් නිර්මාණය කරයි. | • සන්නම හා වෙළෙඳ ලකුණ<br>  • සන්නම<br>  • වෙළෙඳ ලකුණ<br>  • සන්නම හා වෙළෙඳ ලකුණ අතර වෙනස හා සම්බන්ධය<br>  • සන්නමක ගුණාංග<br>  • සන්නම් වර්ග<br>  • සන්නමකින් ලැබෙන ප්‍රයෝජන | 04 |
| | 14.7 නිෂ්පාදිතය සඳහා ආකර්ෂණීය ඇසුරුමක් හා ලේබලයක් සැලසුම් කරයි. | • ඇසුරුම්කරණය<br>  • ඇසුරුම<br>  • ඇසුරුම් වර්ග<br>    • ප්‍රාථමික ඇසුරුම<br>    • ද්විතීයික ඇසුරුම<br>    • ප්‍රවාහන ඇසුරුම<br>  • ඇසුරුමකින් නිෂ්පාදිතයට ලැබෙන ප්‍රතිලාභ<br>  • ඇසුරුමක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු<br>• ලේබල්කරණය<br>  • ලේබලය<br>  • ලේබලයක ඇතුළත් කරුණු | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 14.8 නිෂ්පාදිතය සඳහා යෝග්‍ය මිල තීරණය කරන අයුරු විමසයි. | • මිල<br>• මිල කිරීමේ පරමාර්ථ<br>  • වෙළෙඳපොළෙහි රැඳී සිටීම<br>  • ලාභ උපරිම කිරීම<br>  • වෙළෙඳපොළ කොටස වර්ධනය කර ගැනීම.<br>  • වෙළෙඳපොළ සාරය අත්පත් කර ගැනීම.<br>  • නිෂ්පාදිත ගුණත්ව නායකත්වය ලැබීම.<br>• මිල කිරීමේ ක්‍රම/උපාය මර්ග<br>• මිල කිරීමේ ක්‍රමයක් තේරීම | 05 |
| | 14.9 නිෂ්පාදිතය පාරිභෝගිකයා අතට පත් කිරීම සඳහා සුදුසු බෙදාහැරීමේ මාර්ග තෝරයි. | • බෙදාහැරීම<br>  • වැදගත්කම<br>  • බෙදාහැරීමේ මාර්ග<br>    • පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග<br>    • කාර්මික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග<br>• උචිත බෙදාහැරීම් මාර්ගයක් තීරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු සාධක | 05 |
| | 14.10 නිෂ්පාදිත අලෙවි කිරීම සඳහා යෝග්‍ය ප්‍රවර්ධන උපක්‍රම යෝජනා කරයි. | • ප්‍රවර්ධනය<br>  • වැදගත්කම<br>  • ප්‍රවර්ධන මිශ්‍රය<br>    • ප්‍රචාරණය<br>    • විකුණුම් ප්‍රවර්ධනය<br>    • පෞද්ගලික විකුණුම්<br>    • මහජන සම්බන්ධතා<br>    • සෘජු අලෙවිකරණය<br>  • ප්‍රවර්ධන මිශ්‍රයේ එක් එක් උපාංගයේ වාසි හා සීමා | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| **15. ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මූල්‍ය කළමනාකරණය යොදා ගන්නා අයුරු විමසයි.** | | | 45 |
| | 15.1 ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරණයේ කාර්යභාරය විමසයි. | • මූල්‍ය කළමනාකරණය<br>• මූල්‍ය කළමනාකරණයේ අරමුණ<br>• මූල්‍ය කළමනාකරණ තීරණ<br>  • ආයෝජන තීරණ<br>  • මූල්‍යන තීරණ<br>• ව්‍යාපාරයක මූල්‍ය සැලසුම්කරණය හා පාලනය<br>  • අයවැයකරණය<br>    • මුදල් අයවැය ලේඛනය<br>    • ප්‍රාග්ධන අයවැය ලේඛනය<br>  • මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 05 |
| | 15.2 ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විකල්ප අරමුදල් සම්පාදන මාර්ග තක්සේරු කරයි. | • ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා<br>  • දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා<br>  • කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා<br>• ව්‍යාපාරයකට දිගුකාලීන අරමුදල් අවශ්‍ය වන හේතු<br>• ව්‍යාපාරයකට කෙටිකාලීන අරමුදල් අවශ්‍ය වන හේතු<br>• මූල්‍ය සම්පාදන මාර්ග<br>• අරමුදල් සම්පාදන මාර්ග වර්ගීකරණය<br>  • අභ්‍යන්තර/ බාහිර<br>  • ඍජු/ වක්‍ර<br>  • දිගුකාලීන/ කෙටිකාලීන<br>• මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු<br>• විකල්ප මූල්‍ය සම්පාදන මාර්ගවල වාසි හා අවාසි | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 15.3 මූල්‍ය අනුපාත යොදා ගනිමින් ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය කරයි. | • ව්‍යාපාරයක මූල්‍ය විශ්ලේෂණය<br>• මූල්‍ය ප්‍රකාශ<br>• මූල්‍ය අනුපාත<br>  • ද්‍රවශීලතා අනුපාත<br>  • ලාභදායීත්ව අනුපාත<br>  • ක්‍රියාකාරී අනුපාත<br>  • තෝලන අනුපාත<br>• මූල්‍ය අනුපාත විශ්ලේෂණය | 04 |
| | 15.4 විකල්ප ආයෝජන මාර්ග විමසමින් යෝග්‍ය ආයෝජන මාර්ග තෝරයි. | • ආයෝජන තීරණ<br>  • දිගුකාලීන වත්කම්වල ආයෝජන<br>  • කෙටිකාලීන ආයෝජන<br>    • තොගය<br>    • වෙළෙඳ ආයෝජන<br>    • ණයගැතියෝ<br>    • මුදල් ශේෂය | 04 |
| | 15.5 මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ ව මූල්‍ය වෙළෙඳපොළක සහභාගිත්වය විමසයි. | • ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය<br>  • අර්ථ දැක්වීම<br>  • සංයුතිය<br>    • මූල්‍ය ආයතන<br>    • මූල්‍ය උපකරණ<br>    • මූල්‍ය යටිතල පහසුකම්<br>    • මූල්‍ය වෙළෙඳපොළ<br>    • මධ්‍යම බැංකුව | 04 |
| | 15.6 ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළේ ක්‍රියාකාරීත්වය විමසයි. | • මූල්‍ය වෙළෙඳපොළ<br>  • මුදල් වෙළෙඳපොළ<br>  • ප්‍රාග්ධන වෙළෙඳපොළ<br>• මූල්‍ය වෙළෙඳපොළ සංයුතිය<br>  • අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ<br>  • දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ<br>  • රජයේ සුරැකුම්පත්/ණයකර වෙළෙඳපොළ<br>  • සාංගමික ණය සුරකුම්පත් වෙළෙඳපොළ<br>  • කොටස් වෙළෙඳපොළ | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 15.7 කොළඹ කොටස් හුවමාරුව ආශ්‍රිත කටයුතු විමසයි. | • කොළඹ කොටස් හුවමාරුව<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>• සමාගම්වලට ලියාපදිංචි විය හැකි ආකාරය<br>  • මහජන නිකුතුව මගින්<br>  • විකුණුම් අර්පණයක් මගින්<br>  • හඳුන්වාදීම මගින්<br>• ප්‍රාථමික හා ද්විතියික වෙළෙඳපොළ | 04 |
| | 15.8 කොටස් වෙළෙඳපොළෙහි ගනුදෙනු වන සුරැකුම්පත් හා ඒවායේ ප්‍රතිලාභ විමසයි. | • කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු වන සුරැකුම්පත්<br>  • සාමාන්‍ය කොටස්<br>  • වරණීය කොටස්<br>  • කොටස් බලපත්‍ර<br>  • සාංගමික ණයකර<br>  • රජයේ සුරැකුම්පත්<br>• සුරැකුම්පත්වල ආයෝජනයේ ප්‍රතිලාභ<br>  • ඍජු ප්‍රතිලාභ<br>    • ලාභාංශ<br>    • පොලී<br>    • සංචිත ප්‍රාග්ධනීකරණය<br>    • හිමිකම් නිකුතුව<br>    • ප්‍රාග්ධන ලාභ<br>  • වක්‍ර ප්‍රතිලාභ | 05 |
| | 15.9 කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට සම්බන්ධ ආයතන හා ඒවායේ කාර්යභාරය විමසයි. | • සී/ස කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව හා එහි සංයුතිය<br>• මධ්‍යම තැන්පතු ක්‍රමය<br>  • කාර්ය<br>  • මෙහෙයුම්<br>• තැරැව්කරුවන්<br>• ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>• ඉහත පාර්ශ්ව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට සම්බන්ධ වන ආකාරය | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි සුරැකුම්පත් ගනුදෙනුවන ක්‍රම<br>  • ATS - ස්වයංක්‍රීය ගනුදෙනු ක්‍රමය<br>  • Dex- ඩෙක්ස් ගනුදෙනු ක්‍රමය | |
| | 15.10 ව්‍යාපාර වස්තු වෙළෙඳපොළෙහි කාර්ය සාධනය ඇගයීමට ලක් කරයි. | • කොටස් වෙළෙඳපොළ දර්ශක<br>  • සියලු කොටස් මිල දර්ශකය (ASPI)<br>  • මිලංක මිල දර්ශකය (MPI)<br>  • මුළු ප්‍රතිලාභ දර්ශකය (TRI)<br>• කොටස් වෙළෙඳපොළ දර්ශකවල වැදගත්කම | 04 |
| **16. ව්‍යාපාරයක අරමුණු සඵලදායී ව ඉටුකර ගැනීම සඳහා මානව සම්පත කාර්යක්ෂම ව යොදා ගන්නා අයුරු විමර්ශණය කරයි.** | | | 45 |
| | 16.1 මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම විමසයි. | • මානව සම්පත් කළමනාකරණය<br>  • අර්ථ දැක්වීම<br>  • සෙසු සම්පත්වලට සාපේක්ෂව මානව සම්පතේ සුවිශේෂතා<br>  • අරමුණු<br>    • සේවක ඵලදායකත්වය වර්ධනය කිරීම<br>    • සේවක සංවර්ධනය ඇති කිරීම<br>    • සේවක සුබසාධනය<br>    • රැකියා සඳහා නියමිත වේලාවට නිවැරදි පුද්ගලයන් බඳවා ගැනීම<br>    • යෝග්‍ය සේවකයින් ආයතනයේ රඳවා ගැනීම<br>    • සේවක අභිප්‍රේරණය ඇති කිරීම<br>    • සේවක පිරිවැය පාලනය<br>    • සේවකයින් සම්බන්ධ නීතිමය කොන්දේසි සපුරාලීම | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 16.2 මානවසම්පත් කළමනාකරණයේ කාර්යයක් ලෙස රැකියා නිර්මාණය කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාව අගයයි. | • රැකියා නිර්මාණය<br>• රැකියා විශ්ලේෂණය<br>  • රැකියා විස්තරය<br>  • රැකියා පිරිවිතරය | 04 |
| | 16.3 සංවිධානයක පැවැත්ම සඳහා අවශ්‍ය මිනිස්බල සැලසුම සකස් කරයි. | • මිනිස් බල සැලසුම්කරණය<br>• මිනිස් බල සැලසුම්කරණයේ පියවර<br>  • මානව සම්පත සඳහා ඉල්ලුම පුරෝකථනය කිරීම.<br>  • වර්තමානයේ පවතින මිනිස් බලය විශ්ලේෂණය කිරීම.<br>  • අභ්‍යන්තර සේවක සැපයුම සැලසුම් කිරිම.<br>  • බාහිර සේවක සැපයුම සැලසුම් කිරිම.<br>• මිනිස් බලය සැලසුම් කිරීමේ වැදගත්කම.<br>• මිනිස් බලය සැලසුම් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු | 05 |
| | 16.4 සංවිධානයක රැකියා සඳහා සුදුසු පුද්ගලයින් ආකර්ශනය කර ගත හැකි මාර්ග විමසයි. | • සේවකයින් ආකර්ශනය<br>• සේවකයින් ආකර්ශනය කර ගත හැකි මාර්ග<br>  • අභ්‍යන්තර ආකර්ශන මර්ග<br>  • බාහිර ආකර්ශන මාර්ග<br>• එක් එක් ආකර්ශන මාර්ගයේ වාසි/අවාසි | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 16.5 සේවකයන් අකර්ශනය කර ගැනීම සඳහා රැකියා දැන්වීම පිළියෙල කරයි. | • රැකියා දැන්වීම<br>• රැකියා දැන්වීම් පළ කෙරෙන ස්ථාන<br>  • පුවත්පත<br>  • අන්තර්ජාලය<br>  • රූපවාහිනිය<br>  • ගුවන්විදුලිය<br>  • වෙනත් | 04 |
| | 16.6 ආකර්ශනය කරගත් අයදුම්කරුවන් අතරින් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා යෝග්‍ය ක්‍රම යෝජනා කරයි. | • තෝරා ගැනීම<br>• තෝරා ගැනීමේ ක්‍රම<br>  • ඉල්ලුම් පත් ඇගයීම<br>  • සම්මුඛ පරීක්ෂණ<br>  • බුද්ධි පරීක්ෂණ<br>  • පෞරුෂ පරීක්ෂණ<br>  • ප්‍රායෝගික පරීක්ෂණ<br>  • පසුබිම පරීක්ෂණ<br>  • වෛද්‍ය පරීක්ෂණ | 04 |
| | 16.7 පත්වීම් ලිපියක ආකෘති සකස් කරයි. | • සේවකයින් බඳවා ගැනීම<br>• පත්වීම් ලිපිය<br>• රැකියා ගිවිසුම<br>• පත්වීම් ලිපියක වැදගත්කම<br>• පත්වීම් ලිපියක ඇතුළත් කරුණු<br>• පත්වීම් ලිපියක ආකෘතිය | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 16.8 සංවිධානයේ මානව සම්පත සංවර්ධනය හා රඳවා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි. | • අනුස්ථාපනය<br>• පරිවාස කාලසීමාව<br>• කාර්යඵල ඇගයීම<br>• පුහුණුව හා සංවර්ධනය<br>  • පුහුණු කිරීමේ ක්‍රම<br>  • පුහුණු කිරීමේ ප්‍රතිලාභ<br>    • සේවකයාට<br>    • සේවා යෝජකයාට<br>• සේවක චලනය<br>  • උසස් කිරිම<br>  • මාරු කිරිම<br>  • ඉවත් කිරිම<br>  • සේවය අවසන් කිරීම | 05 |
| | 16.9 මානව සම්පත් කළමනාකරණ කාර්ය ඇගයීමේ නිර්ණායක විමසයි. | • මානව සම්පත් කළමනාකරණ කාර්ය ඇගයීම් නිර්ණායක<br>  • ශ්‍රම පිරිවැටුම<br>  • සේවක ප්‍රවාසිතාව<br>  • ශ්‍රම ඵලදායිත්වය<br>  • කාර්මික සම්බන්ධතා | 05 |
| | 16.10 යහපත් සේව්‍ය සේවක සම්බන්ධතාවක වැදගත්කම අගයයි. | • කාර්මික සම්බන්ධතා/ ශ්‍රමික සම්බන්ධතා<br>  • යහපත් ශ්‍රමික සම්බන්ධතාවල ප්‍රයෝජන<br>  • අයහපත් ශ්‍රමික සම්බන්ධතාවල ප්‍රතිවිපාක<br>• සේව්‍ය-සේවක අයිතිවාසිකම්<br>• සේව්‍ය-සේවක වගකීම්<br>• කාර්මික ආරවුල්<br>• වෘත්තීය සමිති<br>  • සේවක වෘත්තිය සමිති<br>  • සේව්‍ය වෘත්තීය සමිති<br>• සේවක වෘත්තීය සමිතිවල අරමුණු.<br>• වෘත්තීය සමිති ක්‍රියාමාර්ග<br>  • සාමූහික කේවල් කිරීම<br>  • අකුරට වැඩ කිරීම<br>  • සෙමින් වැඩ කිරිම | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| **17. ව්‍යාපාරවල කාර්යක්ෂමතාව හා සඵලදායීත්වය සඳහා තොරතුරු පද්ධති දායක කර ගත හැකි ආකාරය විමසයි.** | | • අතිකාල වැඩවල නොයෙදීම<br>• වැඩ වැරීම<br>  • සංකේත වැඩ වර්ජන<br>  • අඛණ්ඩ වැඩ වර්ජන | 45 |
| | 17.1 සන්නිවේදන තාක්ෂණයේ විකාශනය විවිධ යුග ඔස්සේ විමසමින් තොරතුරුවල අවශ්‍යතාව පෙන්වා දෙයි. | • තොරතුරුවල අවශ්‍යතාව<br>• සන්නිවේදන තාක්ෂණයේ විකාශනය<br>• විවිධ ආර්ථික යුග<br>  • සංචාරක යුගය<br>  • කෘෂිකාර්මික යුගය<br>  • කාර්මික යුගය<br>  • තොරතුරු යුගය<br>• තොරතුරුවල වැදගත්කම | 05 |
| | 17.2 දත්ත සකස් කිරීම විමසමින් තොරතුරු වර්ග කරයි. | • දත්ත<br>• තොරතුරු<br>• දත්ත හා තොරතුරු අතර වෙනස<br>• දත්ත සකස් කිරීම<br>  • කාර්ය<br>  • තාක්ෂණය<br>• තොරතුරුවල ගුණාංග<br>• තොරතුරු වර්ග කිරීම | 05 |
| | 17.3 තොරතුරු පද්ධතියක කාර්ය හා උපාංග විමසමින් පරිගණක තොරතුරු පද්ධති භාවිත කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • පද්ධතිය (System)<br>• තොරතුරු පද්ධති<br>  • අර්ථකථනය<br>  • කාර්ය<br>    • ආදාන<br>    • සැකසීම<br>    • ප්‍රතිදාන<br>    • ගබඩා කිරීම<br>  • උපාංග<br>    • දෘඩාංග<br>    • මෘදුකාංග<br>    • ජීවාංග<br>    • දත්ත<br>    • ක්‍රියාපටිපාටි | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 17.4 තොරතුරු පද්ධති වර්ගීකරණ ක්‍රම විමසමින් භාවිත කරන මට්ටම අනුව තොරතුරු පද්ධති වර්ග කරයි. | • තොරතුරු පද්ධති වර්ගීකරණය<br>  • භාවිත කරන මට්ටම අනුව<br>  • භාවිතය අනුව<br>  • ශ්‍රිත අනුව<br>• භාවිත කරන මට්ටම අනුව තොරතුරු පද්ධති<br>  • උපක්‍රමික මට්ටම<br>  • කළමනාකරණ මට්ටම<br>  • දැනුම් මට්ටම<br>  • මෙහෙයුම් මට්ටම | 05 |
| | 17.5 භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ග කරයි. | • භාවිතය අනුව තොරතුරු පද්ධති<br>  • ගනුදෙනු සැකසුම් පද්ධති (TPS)<br>  • දැනුම් කාර්ය පද්ධති (KWS)<br>  • කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS)<br>  • කළමනාකරණ තොරතුරු පද්ධති (MIS)<br>  • තීරණ උපකාරක පද්ධති (DSS)<br>  • විධායක උපකාරක පද්ධති (ESS) | 05 |
| | 17.6 ශ්‍රිත අනුව තොරතුරු පද්ධති වර්ග කරයි. | • ශ්‍රිත අනුව තොරතුරු පද්ධති<br>  • අලෙවි කළමනාකරණ<br>  • මූල්‍ය කළමනාකරණ<br>  • මෙහෙයුම් කළමනාකරණ<br>  • මානව සම්පත් කළමනාකරණ<br>  • පර්යේෂණ හා සංවර්ධන<br>• විවිධ තොරතුරු පද්ධති අතර සම්බන්ධතාව | 05 |
| | 17.7 තොරතුරු තාක්ෂණය විමසමින් එහි ප්‍රතිලාභ අනාවරණය කරයි. | • තොරතුරු තාක්ෂණ<br>  • අර්ථකථනය<br>• තොරතුරු තාක්ෂණය හා බැඳි වෙනත් තාක්ෂණ<br>  • ගණනය කිරීමේ තාක්ෂණය<br>  • සන්නිවේදන තාක්ෂණය<br>  • තොරතුරු කළමනාකරණ තාක්ෂණය<br>• තොරතුරු තාක්ෂණයේ වැදගත්කම<br>• තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 17.8 පරිගණක ජාල අධ්‍යයනය කරයි. | • පරිගණක ජාල<br>• පරිගණක ජාල වර්ගීකරණය<br>  ◦ පරිගණක සම්බන්ධ වී ඇති ආකාරය අනුව<br>  ◦ භූගෝලීය ව්‍යාප්තිය අනුව<br>  ◦ භාවිත කරන පාර්ශ්වය අනුව (අරමුණ අනුව) | 05 |
| | 17.9 අන්තර්ජාලය භාවිතයට සූදානම ප්‍රදර්ශනය කරයි. | • අන්තර්ජාලය<br>• අන්තර්ජාලය මගින් සලසන සේවා<br>  ◦ ලෝක ව්‍යාප්ත ජාලය(www)<br>  ◦ විද්‍යුත් තැපෑල (email)<br>  ◦ ගොනු හුවමාරු නියමාවලිය (File transfer protocol)<br>  ◦ කතා පහසුකම් (Chat)<br>  ◦ ප්‍රවෘත්ති කණ්ඩායම් (News groups)<br>  ◦ ටෙලි පරිගණක (Tele computing) | 05 |
| **18. ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ව්‍යාපාර සැලැසුම් පිළියෙල කරයි.** | | | 40 |
| | 18.1 ව්‍යාපාර සැලැස්මක මූලිකාංග විමසමින් ව්‍යාපාර අදහසට උචිත ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • ව්‍යාපාර අදහස<br>• ව්‍යාපාර අදහසක් තෝරා ගැනීම<br>  ◦ සාර්ව විශ්ලේෂණය<br>  ◦ සූක්ෂම විශ්ලේෂණය<br>• ව්‍යාපාර සැලැස්ම<br>  ◦ අර්ථ දැක්වීම<br>  ◦ වැදගත්කම<br>  ◦ ව්‍යාපාර සැලැස්මක ඇතුළත් විය යුතු අංග<br>    ▪ විධායක සාරාංශය<br>    ▪ ව්‍යාපාර විස්තරය<br>    ▪ අලෙවි සැලැස්ම<br>    ▪ මෙහෙයුම් සැලැස්ම | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • මානව සම්පත් සැලැස්ම<br>• මූල්‍ය සැලැස්ම<br>  • මූල්‍ය විශ්ලේෂණය | |
| | 18.2 ව්‍යාපාර අදහසට උචිත අලෙවි සැලැස්ම පිළියෙල කරයි. | • අලෙවි සැලැස්ම<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>  • ඇතුළත් විය යුතු කරුණු<br>    • කර්මාන්තය සහ වෙළෙඳපොළ විශ්ලේෂණය<br>    • නිෂ්පාදිතය (භාණ්ඩය හෝ සේවාව)<br>    • ඉලක්ක වෙළෙඳපොළ<br>    • තරගකාරිත්ව විශ්ලේෂණය<br>    • ඉලක්ක අලෙවිය<br>    • තරගකරුවන්ගේ අලෙවි උපාය මාර්ග<br>    • යෝජිත අලෙවි උපාය මාර්ග<br>      • ප්‍රවර්ධන උපාය මාර්ග<br>      • මිල උපාය මාර්ග<br>      • බෙදාහැරීමේ උපාය මාර්ග<br>    • වාර්ෂික විකුණුම් පුරෝකථනය<br>    • අලෙවි වියදම් | 04 |
| | 18.3 අලෙවි සැලැස්මට අනුව මෙහෙයුම් සැලැස්ම පිළියෙල කරයි. | • මෙහෙයුම් සැලැස්ම<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>  • ඇතුළත් විය යුතු කරුණු<br>    • නිෂ්පාදන සැලැස්ම<br>    • ස්ථාවර වත්කම් අවශ්‍යතාව<br>    • අමුද්‍රව්‍ය අවශ්‍යතාව | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • සේවක අවශ්‍යතා<br>• වාර්ෂික නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය<br>• කර්මාන්තශාලා බිම් සැලැස්ම<br>• අපද්‍රව්‍ය බැහැර කිරීමේ හා පාරිසරික බලපෑම්<br>• මුළු නිෂ්පාදන පිරිවැය හා ඒකක පිරිවැය<br>• ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර මෙහෙයුම් කාර්ය හා වියදම් | |
| | 18.4 ව්‍යාපාරයේ මානව සම්පත් සැලැස්ම පිළියෙල කරයි. | • මානව සම්පත් සැලැස්ම<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>• ව්‍යවසායකයින්, හවුල්කරුවන් පිළිබඳ විස්තර<br>• සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්<br>• සංවිධාන සටහන<br>• වාර්ෂික වියදම | 03 |
| | 18.5 මූල්‍ය සැලැස්මේ අන්තර්ගතය විමසමින් ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තු කරයි. | • මූල්‍ය සැලැස්ම<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>• ව්‍යාපෘති පිරිවැය<br>• මුළු ස්ථාවර වත්කම්<br>• මුළු මෙහෙයුම් වියදම්<br>• මුළු කාරක ප්‍රාග්ධනය<br>• ලාභඅලාභ (ආදායම්) ප්‍රකාශය<br>• මුදල් ප්‍රවාහ ප්‍රකාශය<br>• ණය ආපසු ගෙවීමේ සටහන<br>• ඇස්තමේන්තුගත ශේෂ පත්‍රය<br>• ව්‍යාපෘති සාරාංශය | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 18.6 මූල්‍ය සැලැස්මේ අන්තර්ගත මෙහෙයුම් ප්‍රතිඵලය ඇස්තමේන්තු කරයි. | • ලාභ අලාභ (ආදායම්) ප්‍රකාශය<br>• අර්ථ දැක්වීම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>• දළ විකුණුම් ආදායම්<br>• ශුද්ධ විකුණුම් ආදායම්<br>• දළ ලාභය<br>• මුළු වක්‍ර පිරිවැය<br>• ක්‍රියාකාරී ලාභය<br>• බදුවලට පසු ශුද්ධ ලාභය | 04 |
| | 18.7 මූල්‍ය සැලැස්මේ ඇතුළත් ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරයි. | • මුදල් ප්‍රවාහ ප්‍රකාශය<br>• අර්ථ දැක්වීම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>• මුළු මුදල් ගලාඒම<br>• මුළු මුදල් ගලායාම<br>• අවසාන ශේෂය | 03 |
| | 18.8 මූල්‍ය සැලැස්මේ අන්තර්ගත ඇස්තමේන්තුගත ශේෂ පත්‍රය සකස් කරයි. | • ශේෂ පත්‍රය<br>• අර්ථ දැක්වීම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>• ජංගම නොවන වත්කම්<br>• ජංගම වත්කම්<br>• ජංගම වගකීම්<br>• ජංගම නොවන වගකීම්<br>• මුළු යෙදවුම් | 03 |
| | 18.9 මූල්‍ය සැලැස්මට අදාළ ව මූල්‍ය වාර්තා විශ්ලේෂණය කරයි. | • මූල්‍ය වාර්තා විශ්ලේෂණය<br>• සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහය<br>• අනුපාත විශ්ලේෂණය | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 18.10 විධායක සාරාංශය පිළියෙල කරයි. | • විධායක සාරාංශය<br>• ව්‍යාපාරිකයාගේ නම සහ ලිපිනය<br>• ව්‍යාපාරයේ ඉතිහාසය<br>• ව්‍යාපාරයේ පරමාර්ථ<br>• නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩය හෝ සේවාව<br>• තරග කිරීමට සිදුවන වෙළෙඳපොළ<br>• ව්‍යාපාරය සාර්ථකවීමටත්,තරගකාරිත්ව වාසි අත්වීමටත් හේතු<br>• ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම<br>• මුළු ආයෝජනය<br>• ව්‍යාපාරිකයා යොදන ප්‍රමාණය<br>• අපේක්ෂිත ණය ප්‍රමාණය | 05 |
| | 18.11 ව්‍යාපාර සැලැස්ම ඉදිරිපත් කරයි. | • ව්‍යාපාර සැලැස්ම<br>• මුල් පිටුව<br>• පටුන<br>• විධායක සාරාංශය<br>• ව්‍යාපාරය පිළිබඳ විස්තර<br>• නිෂ්පාදිතය හෝ සේවාව<br>• අලෙවි සැලැස්ම<br>• මෙහෙයුම් සැලැස්ම<br>• මානව සම්පත් සැලැස්ම<br>• මූල්‍ය සැලැස්ම<br>• ඇමුණුම් | 04 |
| | | | 310 |

## 4.0 ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමෝපාය

ව්‍යාපාර අධ්‍යයනය ගතික හා සජීවී විෂයකි. එය විද්‍යාව හා තාක්ෂණයේ වෙනස්කම් ද සමාජීය දියුණුව ද හේතුවෙන් නිතර වෙනස්කම්වලට භාජනය වේ. මේ නිසා ම නව සංකල්ප, මූලධර්ම, ප්‍රවේශ හා ආකෘති මෙම විෂයට එකතු වේ. යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ප්‍රායෝගික හා ශිෂ්‍ය කේන්ද්‍රීය වීම අත්‍යවශ්‍ය වේ. ඒ මගින් විෂය කරුණු ඵලදායී ලෙස ග්‍රහණය කර ගැනීමටත්, ශිෂ්‍යයාගේ තෘප්තිය වැඩි කර ගැනීමටත් හැකි වේ. මේ නිසා දැනුම ආකල්ප හා කුසලතා මෙන් ම සමාජ සාරධර්ම ද ව්‍යාපාර ක්ෂේත්‍රයේ සමාජ වගකීම් සහ යුතුකම් ද මැනවින් ග්‍රහණය කරවිය හැකි ක්‍රමවේද භාවිතයට ගැනීම කළ යුතු ය. මෙම විෂයට අයත් විවිධ න්‍යාය, මූලධර්ම හා පරිචය ලැබිය හැකි සේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ය.

නිපුණතා පාදක ව ගොඩනගා ඇති මෙම විෂය නිර්දේශයේ ඇතුළත් ඒ ඒ නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම සඳහා ගවේෂණයක ප්‍රවේශයක් ඔස්සේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගවේෂණාත්මක ඉගෙනුම් ප්‍රවේශය (Inquiry Based Learning Approach) අත්දැකීම් පදනම් කරගත් ඉගෙනුම් ප්‍රවේශය (Experiential Learning Approach) ස්වනිර්මාණ ඉගෙනුම් ප්‍රවේශය (Constructivist Learning Approach) යන මේවා යොදා ගැනීමට යෝජිත ය. ඒ ඒ ඉගෙනුම් ප්‍රවේශ යටතේ භාවිත කළ හැකි ඉගෙනුම්- ඉගැන්වීම් සඳහා නිදසුන් පහත දැක්වේ.

- පොත පත පරිශීලනය හා ස්වයං අධ්‍යයනය
- පැවරුම් හා ව්‍යාපෘති
- නිරීක්ෂණය හා ගවේෂණය
- ගැටලු විසඳීම්
- සාමූහික ඉගෙනුම් කණ්ඩායම් ක්‍රමය
- බුද්ධි කලම්බනය
- ක්‍රීඩා
- විවාද
- භූමිකා රංගන
- නිබන්ධන
- පුහුණු අභ්‍යාස
- ක්ෂේත්‍ර චාරිකා
- සමරූපනය
- සිද්ධි අධ්‍යයනය
- රූපික සංවිධාන ක්‍රමය
- ආදර්ශනය
- ආදර්ශනය
- ක්‍රියාවෙන් ඉගෙනුම්

සෑමවිටක ම ගුරුවරයා සුසාධ්‍යකාරකයකු නියාමනය කරන්නකු හා සම්පත් පුද්ගලයකු ලෙසට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතු ය. ශිෂ්‍යයා නිතර නිර්මාණශීලී චින්තනයට යොමු කරවන හා ව්‍යාපාර ලෝකය සමග ඒකාබද්ධ කළ හැකි කේවල හෝ සාමූහික හෝ ක්‍රියාකාරකම්, පැවරුම්, ව්‍යාපෘති ආදී ප්‍රායෝගික නැඹුරුවක් ඇති ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමෝපා කෙරෙහි විශේෂ යොමු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5.0 පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන්

ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ අපේක්ෂිත අරමුණු හා නිපුණතා ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා පන්ති කාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය බෙහෙවින් ඉවහල් වේ. එබැවින් එයට සරිලන පරිදි පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය කර ගැනීම වැදගත් වේ.

මෙම විෂය සඳහා වර්ෂයකට වෙන් කර ඇති කාලච්ඡේද ගණන 310කි. ඉගෙනුම්- ඉගැන්වීම් කටයුතු සඳහා වර්ෂයකට සාමාන්‍යයෙන් මීට වඩා කාලච්ඡේද ප්‍රමාණයක් වෙන් වී ඇතත්, මෙම විෂය නිර්දේශය සැලසුම් කර ඇත්තේ වර්ෂයකට නියමිත කාලච්ඡේද සංඛ්‍යාවට වඩා අඩු කාලච්ඡේද සංඛ්‍යාවක් ඇතුළත් වන පරිදි ය. මෙම අමතර කාලච්ඡේද ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ය. ඒ අනුව සිසුන්ට තම ඉගෙනුම් අත්දැකීම් තවදුරටත් පෝෂණය කර ගැනීමට අවස්ථාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ව්‍යාපාර අධ්‍යයනය විෂය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රමෝපාය සැලකිල්ලට ගන්නා විට ප්‍රායෝගික නැඹුරුව ඇති විෂය සමගාමී වැඩසටහන් සහ විෂයානුබද්ධ පාසල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අත්‍යවශය කටයුත්තක් වේ. එමගින් ශිෂ්‍යයාගේ සහජ දක්ෂතා ඉස්මතු කර ගැනීමට සහ නිර්මාණශීලී චින්තනයට ඉඩකඩ විවෘත වේ. ඒ සඳහා යොදා ගත හැකි පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

### ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

- වෙළෙඳපොළ සමීක්ෂණ හා පර්යේෂණ
- ව්‍යාපාර අවස්ථා සෙවීම සඳහා සමීක්ෂණ
- සැබෑ ව්‍යාපාර අවස්ථා සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම.
- යෝග්‍ය සරල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කොට වාර්තාවක් සකස් කිරීම.
- වාණිජ සංගමයක් හෝ සමිතියක් ආරම්භ කර පවත්වාගෙන යෑම.
- ව්‍යාපාර දිනයක් පැවැත්වීම.
- ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව සමග සම්බන්ධතාව ඇති කර ගැනීමට යෝග්‍ය වැඩසටහන් සංවිධානය කිරීම.
- ව්‍යාපාර ක්ෂේත්‍රයේ සැබෑ අත්දැකීම් පන්ති කාමරයට ගෙනඒම සඳහා සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.

- සැබෑ ව්‍යාපාර ලෝකයට සිසුන් යොමු කිරීම සඳහා සුදුසු ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.
- පාසල් ආපනශාලාව, සමුපකාර සමිතිය, පාසල් බැංකු ආදී සේවා පවත්වාගෙන යෑම සඳහා ව්‍යාපාර අධ්‍යයන සිසුන් යොමු කිරීම.
- ව්‍යාපාර ක්ෂේත්‍රයේ වැදගත් ස්ථාන වෙත  චාරිකා සංවිධානය කොට ඒ ඇසුරෙන් අධ්‍යයන වාර්තා පිළියෙල කිරීම.
- විශේෂයෙන් ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා අළලා බිත්ති පුවත්පතක් හා සඟරාවක් පවත්වාගෙන යෑමට සිසුන් යොමු කිරීම.
- වෙළෙඳපොළක් සංවිධානය කර පැවැත්වීම මගින් මිල කිරීම, අලෙවිය, ගිණුම් තබා ගැනීම ආදී කටයුතු සමෝධානිත ව සංවිධානය කිරීම.
- ව්‍යාපාර සාරධර්ම හා සමාජ වගකීම් ඇතුළත් නාට්‍ය නිර්මාණය හා රඟ දැක්වීම.
- තරුණ ව්‍යවසායකත්ව ජයාභිමානී වැඩසටහන සමග සම්බන්ධ වී සමාගමක් ආරම්භ කර වර්ෂ දෙක අවසානයේ ඈවර කිරීම.
- තරග සංවාද හා විවාද පැවැත්වීම.
- ව්‍යාපාර ලෝකයේ නව ප්‍රවණතා අන්තර්ජාලය මගින් හඳුනා ගැනීමට යොමු කිරීම.

ඉහත දැක්වෙන ආකාරයේ මෙම විෂයයට සුවිශේෂ වූ ක්‍රියාකාරකම් හා වැඩසටහන් සංවිධානය කිරීම සඳහා ඒ ඒ පාසලට සුවිශේෂ වූ ප්‍රතිපත්තියක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ. මේ නිසා පාසලේ වාර්ෂික වැඩසටහනේ උප වැඩසටහනක් ලෙස මෙම විෂයයට අදාළ ව වර්ෂ දෙකක් සඳහා සුවිශේෂ වැඩසටහනක් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීම සඳහා වාණිජ ගුරුවරුන්ගෙන් හා සිසුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීම යෝග්‍ය වේ. එම කමිටුව විසින් උසස් පෙළ සඳහා  ව්‍යාපාර අධ්‍යයන විෂයයට සමගාමී ව කරනු ලැබීමට අපේක්ෂිත වැඩසටහන් සහ ප්‍රතිපත්ති තීරණය කර පාසලේ වාර්ෂික වැඩසටහන සමග ඒකාබද්ධ කිරීම වඩා සුදුසු ය. මේ සෑම අවස්ථාවක දී ම අධ්‍යාපනයේ සැබෑ ගනුදෙනුකරුවන් වන දරුවන්ගේ සහ දෙමාපියන්ගේ අවශ්‍යතා ද, රාජ්‍ය ප්‍රතිපත්තිය ද පදනම් කර ගත යුතු ය. එමෙන් ම අදාළ සම්පත්, අරමුදල්, පාසල් හා ප්‍රජාව අතර සම්බන්ධය ද මනාව අධ්‍යයනයට භාජන කිරීම අවශ්‍ය ය.

## 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය. මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමුවරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.  මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.